# පරිසරය

## 4 ශ්‍රේණිය



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education



# 13. පොළොව හා අහස

අපට පෙනෙන ගස්වැල්, සතුන්,කඳු , ගංගා, දිය ඇලි, මහ මුහුද , නිවාස යන සියල්ලම පිහිටා ඇත්තේ පොළොව මතයි. වැස්ස, සුළඟ වැනි ස්වාභාවික සාධක හේතුවෙන් පොළොව මතුපිට වෙනස්වීම් සිදුවේ. එසේම කොතෙක් සුන්දරව පොළොව පැවතුණත් මිනිසාගේ නොයෙකුත් අවශ්‍යතාවයන් වෙනුවෙන්ද භූමිය වෙනස් කරනු ලබයි. මේ අනුව

- ස්වාභාවික සාධක
- මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් පොළොව යම් හිතකර මෙන්ම අහිතකර වෙනස්වීම් වලට භාජනය වේ.

## ක්‍රියාකාරකම 1

- ඔබේ ගෙවත්තේ භූමිය නිරීක්ෂණය කරන්න.
- පහත කරුණු පිළිබඳ විශේෂ අවධානය යොමුකර වාර්තා ගතකරන්න.

1. පසේ වර්ණය කුමක්ද?

 ..........................................................................................................

2. වැඩිපුර දැකිය හැක්කේ වැලි/මැටි/ බොරලු පසක්ද?

 ..........................................................................................................

3. පසෙහි වෙසෙන කුඩා ජීවීන් බහුලව සිටීද?

 ..........................................................................................................

4. පසට එකතු වී ඇති කසළ ද්‍රව්‍ය ප්‍රමාණය වැඩිද?

 ..........................................................................................................


Copyright© www.e-thaksalawa.moe.gov.lk



## ක්‍රියාකාරකම 2

- ගෙවත්තෙන් සපයාගත් පස් කුඩා ප්‍රමාණයක් බෝතලයකට දමා රූපයේ පරිදි වතුර පුරවා සොලවා තබන්න.




- පහත කරුණු නිරීක්ෂණය කරන්න.

1. බෝතලයේ පතුලේ තැන්පත්වී ඇති ද්‍රව්‍ය මොනවාද?

   ..............................................................................................................................

2. ඊට ඉහළින් තැන්පත්වී ඇති ද්‍රව්‍ය මොනවාද?

   ..............................................................................................................................

3. ජලයේ පාවෙන ද්‍රව්‍ය මොනවාද?

   ..............................................................................................................................


4. ජලයේ වර්ණය වෙනස්වී ඇති ආකාරය කෙසේද?


   ..............................................................................................................................

| |
|---|
| ඔබේ ගෙවත්තේ භූමිය ආරක්ෂාකර ගැනීමට ඔබත් දායක වන්න |


Copyright© www.e-thaksalawa.moe.gov.lk

- ❖ හිරු එළියෙන් අපට ආලෝකය ලැබේ.
- ❖ එසේම අපට උණුසුම ලැබේ.
- ❖ හිරු එළිය ශාක වැඩීමට උපකාරී වේ.
- ❖ හිරු එළියෙන් අපට තෙත දේවල් වියළා ගැනීමට හැකිය.
- ❖ හිරු එළියෙන් විදුලි බලය නිපදවා ගනී .





## ක්‍රියාකාරකම 3

- සෙවන සහිත ස්ථානයක් සහ හොඳින් හිරු එළිය වැටෙන ස්ථානයක් තෝරාගන්න. තෙත රෙදි කැබලි දෙකක් මෙම ස්ථාන දෙකෙහි වනා ඉක්මනින් වේළෙන්නේ කුමන ස්ථානයේ වැනූ රෙදි කැබැල්ල දැයි නිරීක්ෂණය කරන්න.

  - **ඔබගේ නිරීක්ෂණය කුමක් ද?**

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................


..............................................................................................................

සෙවන සහිත ස්ථානවල තබන දේවල් වලට වඩා හිරු එළිය ඇති ස්ථානවල තබන දේවල් ඉතා ඉක්මනින් වියළෙයි.



Copyright© www.e-thaksalawa.moe.gov.lk

## ක්‍රියාකාරකම 4

- ජලය මිලිලීටර් 100 කට ලුණු ග්‍රෑම් 10 ක් වන පරිදි පහත රූපයේ පෙනෙන ආකාරයට භාජනයකට දමා දියකර හොඳින් හිරු එළිය පතිත වන ස්ථානයක තබන්න. සිදුවන දේ නිරීක්ෂණය කරන්න.



ලුණුජලය



නිරීක්ෂණයෙන් සිදුවුදේ වාර්තා කරන්න.

| |
|---|
| මේ ආකාරයට ලුණු ලේවායන්වල මුහුදු ජලය හිරු එළියෙන් වියලා, ලුණු සාදනු ලැබේ. |

## ක්‍රියාකාරකම 5

- පහත ද්‍රව්‍ය සපයා ගන්න.
  - ❖ ප්‍රමාණයෙන් වෙනස් නමුත් ආසන්න දන්තාලේප අසුරන දෙකක්
  - ❖ ටිෂු කඩදාසියක්, කළු කඩදාසියක්
  - ❖ ඇල්පෙනෙත්තක්, ගම්, කතුරු
- ප්‍රමාණයෙන් විශාල අසුරනයේ එක් කෙළවරක පියන ඉවත්කර කළු කඩදාසියක් අලවා ගන්න. එහි හරි මැද ඇල්පෙනෙත්තකින් විද සිදුරක් සකසා ගන්න. අසුරනය අනෙක් කෙළවරින් කපා දිග අඩුකර ගන්න.
- ප්‍රමාණයෙන් කුඩා අසුරනයේ දෙකෙළවර පියන් ඉවත් කර එක් විවෘත කළ කෙළවරක ටිෂු කඩදාසිය අලවා ගන්න.


Copyright© www.e-thaksalawa.moe.gov.lk



- ටිෂු කඩදාසිය ඇලවූ පැත්ත මුලින් ඇතුළු වන සේ විශාල අසුරනය තුළට කුඩා අසුරනය ඇතුළු කරන්න. ආලෝකය සහිත පරිසරයක ඇති යම් වස්තුවක් දෙසට සිදුරු කැමරාව යොමුකර විවෘත කෙළවරට ඇස තබා බලන්න.
- ටිෂු කඩදාසිය මතට වස්තුවේ යටිකුරු ප්‍රතිබිම්බයක් ලැබෙන තෙක් සිදුරු කැමරාව සීරු මාරු කරන්න.



අපට ජලය ලැබෙන ප්‍රධානතම මාර්ගය වන්නේ වර්ෂාවයි. වර්ෂාව ස්වභාවිකව ලැබෙන දායාදයකි. වර්ෂාවෙන් ලැබෙන ජලය ඇළ, දොළ , පොකුණු, ගංගාවල රැස්කර ගැනීමෙන් ප්‍රයෝජනයට ගනී . ආදිතම මුතුන් මිත්තෝ වැසි ජලය රැස් කර ගැනීම සඳහා වැව් පොකුණු සෑදූහ. ඒ අතර මහා පරාක්‍රම බාහු රජතුමා වැව් සෑදීම සඳහා විශාල මෙහෙයක් සිදු කළ රජකෙනෙකි. මහා පරාක්‍රම බාහු රජු විසින් ප්‍රකාශ කරන ලද ජනප්‍රිය කියමනක් පහත වෙයි.

“ අහසින් වැටෙන එක ජල බිංදුවක් හෝ අපතේ නොයවා ප්‍රයෝජනයට ගත යුතුය.”

- ❖ වැසි ජලය වැව් අමුණු බැඳ එක්රැස් කොට ගොවිතැන් කටයුතුවලට භාවිත කළ හැකිය.
- ❖ වැසි ජලය රැස්කර ගොඩනැගිලි සෑදීමට භාවිත කිරීමට හැකිය.
- ❖ වැසි ජලය ජලාශවල රැස් කර ගැනීමෙන් විදුලි බලය නිපදවා ගැනීමට හැකිය.
- ❖ වාහන සේදීම වැනි කර්මාන්ත සඳහා ද වැසි ජලය භාවිත කිරීමට හැකිය.



Copyright© www.e-thaksalawa.moe.gov.lk



## ක්‍රියාකාරකම 6

- ස්ථාන කිහිපයකින් පතුල සිදුරු කරන ලද ප්ලාස්ටික් බෝතලයක් සපයාගන්න.
- ගෙවත්තේ මිශ්‍ර පසක් සහිත ස්ථානයක් තෝරාගන්න. (වැලි, මැටි,බොරලු සහිත)
- තෝරාගත් භූමියේ සෙ.මී. 30 X30 පමණ ප්‍රමාණයකට ඉහළින් පතුල සිදුරු කරන ලද උස බෝතලයට ජලය පුරවා අල්ලා සිටින්න.
- මිනිත්තු 2/3 ක් අඛණ්ඩව ජලය වැටීමට සලස්වන්න.
- සිදුවන දේ නිරීක්ෂණය කර වාර්තා කරන්න.


..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................




Copyright© www.e-thaksalawa.moe.gov.lk